57399

AL/2023(2024)/33/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

**උපදෙස්:**
- ※ පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ※ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- ※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.
- ※ මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

1. සිමිත රුවිනි පොදු සමාගම නිෂ්පාදන සමාගමක් වන අතර එය තනි භාණ්ඩයක් නිපදවයි. 2023.03.31 දිනට එහි සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැය | 85 000 | |
| 2022.04.01 දිනට සමුච්චිත ක්ෂය | | 12 500 |
| භාවිත අයිතිය සහිත වත්කම - කාර්යාල ගොඩනැගිල්ල | 21 000 | |
| කල්බදු වගකීම - කාර්යාල ගොඩනැගිල්ල | | 21 000 |
| මෝටර් රථය විකිණීමෙන් ලද ලාභය | | 600 |
| විකුණුම් | | 75 900 |
| විකුණුම් පිරිවැය | 45 200 | |
| තොග - අමුද්‍රව්‍ය | 600 | |
| - නිමි භාණ්ඩ | 3 600 | |
| වෙනත් ආදායම් | | 2 200 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9 150 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 6 500 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 300 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 40 000 |
| 2022.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 24 000 |
| බෙදාහැරීමේ පිරිවැය | 8 900 | |
| පරිපාලන වියදම් | 7 500 | |
| වෙනත් වියදම් | 1 000 | |
| මූල්‍ය පිරිවැය | 500 | |
| ගෙවූ ආදායම් බදු | 1 100 | |
| 2022.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 350 |
| 2022.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | | 800 |
| | 183 850 | 183 850 |

[ දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අතිරේක තොරතුරු:

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතු වේ.

(i) ප්‍රවර්තන වර්ෂය තුළදී භාණ්ඩ ඒකක 10 000 ක් නිෂ්පාදනය කරන ලදී. මෙම ඒකකවලින් 10% ක් 2023.03.31 දිනට නොවිකිණී තිබූ අතර ඒවා අවසාන නිමි භාණ්ඩ තොගය ලෙස දක්වා ඇත. ශේෂ පිරික්සුමේ දක්වා ඇති විකුණුම් පිරිවැය සහ අවසාන නිමි භාණ්ඩ තොගයේ පිරිවැය ගණනය කිරීමේදී භාණ්ඩ නිෂ්පාදනයට අදාළ ක්ෂය සැලකිල්ලට ගෙන නොමැත. මෙම ව්‍යාපාරයෙහි නොනිමි තොග නොමැති බව උපකල්පනය කරන්න.

(ii) සමාගම සතුව තිබූ මෝටර් රථය 2022.04.01 දින රු. 4 000 000 කට විකුණන ලද අතර, එයින් රු. 600 000 ක ලාභයක් ඇති විය. මෙදිනට මෙම මෝටර් රථයේ සමුච්චිත ක්ෂය රු. 2 100 000 ක් විය. මෙම විකිණීම නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(iii) ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති දේපළ, පිරියත සහ උපකරණ, සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය, එම වත්කම්වල ඵලදායී ජීවකාලය ද සමග පහත දී ඇත. (මෙම තොරතුරු සපයා ඇත්තේ ඉහත (ii) හි දක්වා ඇති මෝටර් රථය විකිණීම ගිණුම්ගත කිරීමෙන් පසුව ය.)

| විස්තරය | 2023.03.31 දිනට පිරිවැය (රු.'000) | 2022.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) | ඵලදායී ජීවකාලය (වසර) |
|---|---|---|---|
| ඉඩම | 7 000 | – | – |
| කර්මාන්තශාලා ගොඩනැගිල්ල | 28 000 | 5 000 | 14 |
| නිෂ්පාදන පිරියත | 38 000 | 4 000 | 7 |
| කාර්යාල උපකරණ | 12 000 | 3 500 | 5 |
| | 85 000 | 12 500 | |

ගැළපුම (ii), (iv) සහ (v) හි දක්වා ඇති දෑවලට අමතරව වෙනත් දේපළ, පිරියත සහ උපකරණ මිල දී ගැනීම, ඉවත් කිරීම් හෝ ප්‍රත්‍යාගණනය කිරීම් වර්ෂය තුළදී සිදුකර නොමැත. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂය වෙන්කළ යුතු වේ. සියලු දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල ප්‍රත්‍යාබුත් අගය ශුන්‍ය වේ යැයි උපකල්පනය කරන්න.

(iv) 2023.03.31 දින ව්‍යාපාරයේ ඉඩම ප්‍රථම වරට රු. 6 400 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(v) 2023.03.20 දින නව නිෂ්පාදන පිරියතයක් රු. 10 000 000 කට සමාගම විසින් මිල දී ගන්නා ලද අතර, එය නිෂ්පාදන පිරියත ගිණුමට හර කර ඇත. මෙම පිරියතයේ සවිකිරීමේ පිරිවැය සහ මූලික පරීක්ෂණ පිරිවැය පිළිවෙළින් රු. 2 000 000 ක් සහ රු. 1 500 000 ක් 2023 මාර්තු මාසය තුළදී දරන ලදී. මෙම පිරිවැය අයිතම දෙකම පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත. මූලික පරීක්ෂණ පිරිවැය සමන්විත වන්නේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩවල අමුද්‍රව්‍ය පිරිවැය රු. 1 000 000 කින් සහ මාන්නිය ගාස්තු රු. 500 000 කින් ය. මූලික පරීක්ෂණයේදී නිපදවන ලද භාණ්ඩ අලෙවි ප්‍රවර්ධනය සඳහා නොමිලේ බෙදා දී ඇත. 2023.04.01 දින සිට මෙම පිරියතය භාවිතය සඳහා පවතී.

(vi) 2022.04.01 දින සමාගම විසින් එහි කාර්යාලය ලෙස භාවිත කිරීමට වසර 5 ක කාලයක් සඳහා ගොඩනැගිල්ලක භාවිත අයිතිය කල්බදු ගිවිසුමක් යටතේ ලබාගන්නා ලදී. මෙම ගොඩනැගිල්ලෙහි ඵලදායී ජීවකාලය වසර 25 කි. කල්බදු කාලසීමාව අවසානයේදී මෙම ගොඩනැගිල්ලෙහි අයිතිය සමාගමට මාරු නොවේ. 2022.04.01 දිනට කල්බදු වාරිකවල වර්තමාන වටිනාකම රු. 21 000 000 ක් විය. කල්බදු ගිවිසුමට අනුව රු. 5 000 000 බැගින් වූ සමාන වාර්ෂික වාරික 5 ක් කල්බදු කාලසීමාව තුළදී ගෙවිය යුතු අතර, පළමු වාරිකය 2023.03.31 දින ගෙවිය යුතු විය. කෙසේ වුව ද, නියමිත දින කල්බදු වාරිකය ගෙවීමට සමාගමට නොහැකි වූ අතර, එය 2023.06.30 දින ගෙවන ලදී. 2023.03.31 සහ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා අදාළ කල්බදු පොලිය පිළිවෙළින් රු. 1 280 000 ක් සහ රු. 1 055 000 ක් වේ. මෙම කල්බද්ද සඳහා මූලික ගෙවීම් හෝ මූලික සෘජු පිරිවැයක් නොමැති බව උපකල්පනය කරන්න. කල්බදු වාරිකවල වර්තමාන වටිනාකම භාවිත අයිතිය සහිත වත්කම් ගිණුමට හරකර, කල්බදු වගකීම් ගිණුමට බැරකර ඇත. මෙම කල්බද්ද සඳහා වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත.

(vii) සමාගම භාණ්ඩ අලෙවිකරනු ලබන්නේ වසරක වගකීම් සහතිකයක් සහිතව වන අතර, 2023.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 1 150 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වගකීම් සහතික යටතේ භාණ්ඩ අලුත්වැඩියා කිරීමට රු. 600 000 ක් වැය කරන ලද අතර, එය බෙදාහැරීමේ පිරිවැය [illegible]

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(viii) ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු සමන්විත වන්නේ පසුගිය වසර සඳහා ගෙවූ රු. 450 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද බදුවලිනි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 800 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ix) 2022.04.01 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සමන්විත වන්නේ කොටසක් රු. 10 බැගින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස්වලිනි. සමාගම විසින් 2022.10.01 දිනට පැවති සෑම කොටස් 5 කට 1 කොටස බැගින් වූ අනුපාතයකට කොටසක් රු. 10 බැගින් රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරන ලදී. කෙසේ වුව ද, මේ සඳහා කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත. තවද, 2023.01.01 දින සමාගම විසින් රු. 10 000 000 ක් වූ මහජන කොටස් නිකුතුවක් සිදුකරන ලද අතර, එය නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(x) රු.1 500 000 ක් වූ අධ්‍යක්ෂ ගාස්තු පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇති අතර, සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ රු. 800 000 ක අතුරු ලාභාංශ වෙනත් වියදම් තුළ ඇතුළත් කර ඇත.

**අවශ්‍යවන්නේ:**

'LKAS 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත රුවිනි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

2\. (අ) ලක්මිණි ට්‍රේඩර්ස් පොත් වෙළෙඳසැලක් පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපාරය සේවකයින් තිදෙනෙකු සේවයේ යොදවා ඇති අතර ඔවුන්ගේ 2023 දෙසැම්බර් මාසයේ වැටුප්වලට අදාළ තොරතුරු පහත දී ඇත.

| සේවක අංකය | ජීවන වියදම් දීමනාව (රු.) | සේවක ණය අඩු කිරීම් (රු.) | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍ය දායකත්වය (රු.) |
|---|---|---|---|
| 001 | 10 000 | 15 000 | 6 000 |
| 002 | 10 000 | — | 9 000 |
| 003 | 10 000 | 10 000 | 7 500 |

**අතිරේක තොරතුරු:**

- EPF සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේව්‍ය සහ සේවක දායකත්වයන් පහත පරිදි වේ.

| | EPF | ETF |
|---|---|---|
| සේව්‍ය | 12% | 3% |
| සේවක | 8% | — |

- EPF සහ ETF දළ වැටුප මත ගණනය කරනු ලබයි.
- සේවකයන්ගේ දළ වැටුප සමන්විත වන්නේ මූලික වැටුපෙන් සහ දීමනාවලිනි.
- ඉහත සඳහන් දෑ හැර වෙනත් දීමනා හෝ අඩු කිරීම් හෝ නොමැත.
- යම්කිසි මාසයක, EPF සහ ETF දායකත්වයන් ඊළඟ මාසයේ පළමු සතියේදී අදාළ අරමුදල් වෙත ප්‍රේෂණය කරනු ලබයි.

**අවශ්‍යවන්නේ:**

2023 දෙසැම්බර් මාසය සඳහා:

(1) එක් එක් සේවකයාගේ දළ වැටුප

(2) ව්‍යාපාරයේ වැටුප් ලේඛනය

(3) පහත දෑ සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (සංලක්ෂය සහිතව):

(i) වැටුප් වියදම

(ii) සේවක ණය අඩුකිරීම

(iii) EPF වගකීම

(iv) ETF වගකීම **(ලකුණු 15 යි)**

/හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) නිෂ්පාදන සමාගමක් විසින් 'P' සහ 'Q' නම් වූ භාණ්ඩ දෙකක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා 'එකලස්' සහ 'නිමැවුම්' නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙක සහ 'ගබඩාව' යන සේවා පිරිවැය මධ්‍යස්ථානය මෙම සමාගම සතු වේ. මෙම සියලුම පිරිවැය මධ්‍යස්ථාන එකම ගොඩනැගිල්ලක පිහිටා ඇත.

මෙම වර්ෂය සඳහා අයවැයගත පොදුකාර්ය පිරිවැය මත පදනම්ව සමාගම විසින් දැනටම ගණනය කර ඇති පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත පහත දී ඇත.

- එකලස් පිරිවැය මධ්‍යස්ථානය - යන්ත්‍ර පැයක් සඳහා රු. 20
- නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානය - සෘජු ශ්‍රම පැයක් සඳහා රු. 25

කෙසේ වුව ද මෙම අනුපාත ගණනය කිරීමේදී පහත අයවැයගත පොදුකාර්ය පිරිවැය සැලකිල්ලට ගෙන නොමැති බව පසුව අනාවරණය විය.

- ගොඩනැගිල්ලේ විදුලි පිරිවැය රු. 80 000
- ගොඩනැගිල්ලේ ක්ෂය රු. 200 000
- ගොඩනැගිල්ල සඳහා රක්ෂණ වාරිකය රු. 100 000
- එකලස් පිරිවැය මධ්‍යස්ථානයේ නඩත්තු පිරිවැය රු. 20 000

පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ තොරතුරු:

| | එකලස් | නිමැවුම් | ගබඩාව |
|---|---|---|---|
| භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | 6 000 | 3 000 | 1 000 |
| කිලෝවොට් පැය | 2 500 | 1 000 | 500 |
| මුළු අයවැයගත යන්ත්‍ර පැය | 40 000 | 12 000 | — |
| මුළු අයවැයගත සෘජු ශ්‍රම පැය | 6 000 | 24 000 | — |

ගබඩාවේ මුළු පොදුකාර්ය පිරිවැය පිළිවෙලින් 3:1 අනුපාතයට එකලස් සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථාන අතර නැවත විභජනය කරනු ලබයි.

වර්ෂය තුළදී 'P' සහ 'Q' භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අදාළ තොරතුරු පහත දී ඇත.

| | P භාණ්ඩය | Q භාණ්ඩය |
|---|---|---|
| ඒකකයක් සඳහා සෘජු අමුද්‍රව්‍ය පිරිවැය (රු.) | 216 | 129 |
| ඒකකයක් සඳහා සෘජු ශ්‍රම පිරිවැය (රු.)<br>(සෘජු ශ්‍රම පැයක් සඳහා වේතනය රු. 100 ක් වේ.) | ? | ? |
| ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සත්‍ය සෘජු ශ්‍රම පැය: | | |
| - එකලස් | 2 | 1 |
| - නිමැවුම් | 1 | 3 |
| ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සත්‍ය යන්ත්‍ර පැය: | | |
| - එකලස් | 2 | 3 |
| - නිමැවුම් | 1 | 2 |
| ඒකකයක් සඳහා නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය (රු.) | 100 | 150 |

අවශ්‍යවන්නේ:

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එකලස් සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථාන සඳහා සංශෝධිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත

(3) 'P' භාණ්ඩයේ ඒකකයක් සඳහා මුළු නිෂ්පාදන පිරිවැය සහ 'Q' භාණ්ඩයේ ඒකකයක් සඳහා මුළු පිරිවැය

(4) මුළු පිරිවැය මත 20% ක ලාභයක් පවත්වාගෙන යන්නේ නම්:

(i) 'P' භාණ්ඩ ඒකකයක විකුණුම් මිල

(ii) 'Q' භාණ්ඩ ඒකකයක විකුණුම් මිල

(ලකුණු 25 යි)

(මුළු ලකුණු 40 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

3. (අ) මාලා එන්ටර්ප්‍රයිසස් ඒකල ස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2023.03.31 දිනට එහි සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.

| | 2023.03.31 දිනට (රු.'000) |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 3 000 |
| තොගය | 250 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 400 |
| මුදල් | 40 |
| **මුළු වත්කම්** | **3 690** |
| | |
| හිමිකම | 2 830 |
| බැංකු ණය | 800 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 60 |
| **හිමිකම හා මුළු වගකීම්** | **3 690** |

2023 අප්‍රේල් මාසය තුළදී පහත ගනුදෙනු ව්‍යාපාරයේ සිදුවිය.

| අංකය | ගනුදෙනුව |
|---|---|
| 1 | අයිතිකරු විසින් රු. 700 000 ක් වටිනා ඉඩමක් සහ රු. 200 000 ක මුදල් අතිරේක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී. |
| 2 | ලැයිස්තුගත මිල රු. 1 350 000 ක් වූ භාණ්ඩ ණයට මිල දී ගන්නා ලද අතර, මේ සඳහා රු. 50 000 ක වෙළෙඳ වට්ටමක් ලැබුණි. |
| 3 | පිරිවැය රු. 800 000 ක් වූ භාණ්ඩ රු. 1 400 000 කට ණයට විකුණන ලදී. |
| 4 | පිරිවැය රු. 500 000 ක් වූ ලී බඩු ව්‍යාපාරයේ භාවිතය සඳහා මිල දී ගන්නා ලදී. එදිනම රු. 200 000 ක් මේ සඳහා ගෙවූ අතර, ඉතිරිය 2023 මැයි මාසයේදී ගෙවීමට එකඟ විය. |
| 5 | මාසය තුළදී මිල දී ගත් පිරිවැය රු. 20 000 ක් වූ භාණ්ඩ සැපයුම්කරු වෙත ආපසු යවන ලදී. |
| 6 | මාසය තුළදී රු. 50 000 කට විකුණූ භාණ්ඩ ණයගැතියෙකු විසින් ආපසු එවන ලදී. එම භාණ්ඩවල පිරිවැය රු. 30 000 ක් විය. |
| 7 | බැංකු ණය සඳහා රු. 70 000 ක මාසික ණය වාරිකයක් ගෙවන ලදී. මෙම වාරිකය තුළ රු. 15 000 ක පොලියක් ඇතුළත් වේ. |
| 8 | ධාරණ වටිනාකම රු. 900 000 ක් වූ ව්‍යාපාරයේ ඉඩමක් අත්පිට මුදලට රු. 1 600 000 කට විකුණන ලදී. |
| 9 | 10% ක වට්ටමක් දීමෙන් පසුව රු. 900 000 ක මුදලක් වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබුණි. |
| 10 | පිරිවැය රු. 500 000 ක් වූ භාණ්ඩ අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. |
| 11 | පිරිවැය රු. 60 000 ක් වූ ව්‍යාපාරයේ භාණ්ඩ, අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික භාවිතයට ලබා ගන්නා ලදී. |
| 12 | රු. 50 000 ක වට්ටමකට යටත්ව වෙළෙඳ ණයහිමියෙකුට ගෙවිය යුතු රු. 300 000 ක් පියවන ලදී. |
| 13 | පිරිවැය රු. 100 000 ක තොගයක් විනාශ වූ අතර, රක්ෂණ සමාගම මෙම අලාභයෙන් 80% ක් ගෙවීමට එකඟ විය. |
| 14 | 2023 අප්‍රේල් මාසය සඳහා මෙහෙයුම් වියදම වූ රු. 500 000 ක් ගෙවන ලදී. |
| 15 | 2023 අප්‍රේල් මාසය සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත රු. 20 000 ක ක්ෂය වෙන් කරන ලදී. |

අවශ්‍යවන්නේ:

(1) 2023.04.01 දිනට ශේෂ සටහන් කර අංක 1 සිට 15 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

| ශේෂය/ගනුදෙනු අංකය | වත්කම් | | | = | වගකීම් + | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | මුදල් | බැංකු ණය | වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | |
| 2023.04.01 දිනට ශේෂය | | | | | | | |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| .... | | | | | | | |
| .... | | | | | | | |
| 2023.04.30 දිනට ශේෂය | | | | | | | |

(2) ශුද්ධ වත්කම් පදනම භාවිත කරමින් 2023.04.30 දිනෙන් අවසන් මාසය සඳහා ලාභය හෝ අලාභය

(ලකුණු 30 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) පාසලක ආදි ශිෂ්‍ය සංගමයක මූලික අරමුණ වන්නේ මූල්‍ය අපහසුතා ඇති සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම ය. මෙම සංගමයට අදාළ තොරතුරු පහත දී ඇත.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන:**

| | 2023.12.31 දිනට (රු.'000) | 2023.01.01 දිනට (රු.'000) |
|---|---|---|
| කාර්යාල උපකරණ - ධාරණ වටිනාකම | 2 750 | 500 |
| ස්ථාවර තැන්පතුව | 6 000 | – |
| ලැබිය යුතු සාමාජික මුදල් | 500 | 600 |
| සංගීත සංදර්ශනයේ අනුග්‍රාහකයින්ගෙන් ලැබිය යුතු මුදල් | 600 | – |
| ස්ථාවර තැන්පතුවෙන් ලැබිය යුතු පොලී ආදායම | 100 | – |
| මුදල් | 1 025 | 2 500 |
| **මුළු වත්කම** | 10 975 | 3 600 |
| සමුච්චිත අරමුදල | ? | 2 700 |
| ශිෂ්‍යත්ව අරමුදල | ? | 450 |
| කලින් ලද සාමාජික මුදල් | 550 | 450 |
| **හිමිකම සහ මුළු වගකීම** | 10 975 | 3 600 |

**2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම:**

| | රු.'000 | රු.'000 |
|---|---|---|
| 2023.01.01 දිනට මුදල් ශේෂය .................................................... | | 2 500 |
| **ලැබීම්:** | | |
| සාමාජික මුදල් .................................................... | 1 500 | |
| ශිෂ්‍යත්ව සඳහා පරිත්‍යාග .................................................... | 6 300 | |
| සංගීත සංදර්ශනයේ ප්‍රවේශපත්‍ර අලෙවියෙන් ලැබීම් .................................. | 1 100 | |
| සංගීත සංදර්ශනය සඳහා අනුග්‍රාහකයින්ගෙන් ලද මුදල් ............................ | 400 | |
| ස්ථාවර තැන්පතුවෙන් ලද පොලිය .................................................... | 800 | 10 100 |
| **ගෙවීම්:** | | |
| ශිෂ්‍යත්ව සඳහා ගෙවීම් .................................................... | 1 800 | |
| කාර්යාල වියදම් .................................................... | 575 | |
| සංගීත සංදර්ශනයේ වියදම් .................................................... | 700 | |
| කාර්යාල උපකරණ මිල දී ගැනීම .................................................... | 2 500 | |
| 2023.04.01 දින ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතුව (වසර දෙකක් සඳහා) | 6 000 | 11 575 |
| 2023.12.31 දිනට මුදල් ශේෂය .................................................... | | 1 025 |

**අතිරේක තොරතුරු:**

- ශිෂ්‍යත්ව ලබාදීම සඳහා වර්ෂයක් තුළදී ලද පරිත්‍යාග, ශිෂ්‍යත්ව අරමුදල් ගිණුමට බැර කරනු ලැබේ. වර්ෂයක් තුළදී ශිෂ්‍යත්ව ලබාදීම සඳහා පරිත්‍යාග භාවිත කරනු ලබන ප්‍රමාණයට සමාන වටිනාකමක් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වේ.
- වර්ෂය තුළදී කාර්යාල උපකරණ ඉවත් කිරීම් නොමැත.
- ස්ථාවර තැන්පතුවේ වාර්ෂික පොලී අනුපාතය 20% ක් වේ.

**අවශ්‍යතාවන්:**

(1) 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම

(2) 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ ආදායම් ප්‍රකාශනය

(3) 2023.12.31 දිනට ආදි ශිෂ්‍ය සංගමයේ සමුච්චිත අරමුදලෙහි ශේෂය **(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 40 යි)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4. (අ) සීමිත සුමුදු (පෞද්ගලික) සමාගම තොග වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගනු ලබයි. මෙම සමාගම විසින් ණය පදනමට පමණක් භාණ්ඩ මිල දී ගනු ලබන අතර ණය පදනමට මෙන්ම අත්පිට මුදලට ද භාණ්ඩ විකුණනු ලබයි. මෙම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත.

පහත තොරතුරු 2023 දෙසැම්බර් මාසය සඳහා අදාළ වේ.

(i) සමාගමේ වත්කම් සහ වගකීම් ශේෂ:

| | 2023.12.31 දිනට (රු.'000) | 2023.12.01 දිනට (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකමට | 1 310 | 1 100 |
| මුදල් | ? | 150 |
| තොගය | 300 | 200 |
| වෙළෙඳ ණයගැතියෝ | ? | 300 |
| වෙළෙඳ ණයහිමියෝ | ? | 240 |
| VAT පාලන ගිණුම - බැර ශේෂය | ? | 100 |
| උපචිත වියදම් | 60 | 40 |

(ii) 2023.12.01 දිනට වෙළෙඳ ණයගැති සහ වෙළෙඳ ණයහිමි පාලන ගිණුම් ශේෂයන් එදිනට අදාළ උප ලෙජර ගිණුම් ශේෂයන්වල එකතුත් සමඟ එකඟ විය.

(iii) ණයගැති සහ ණයහිමි උප ලෙජරවලින් උපුටාගන්නා ලද 2023 දෙසැම්බර් මාසය සඳහා සමාගමේ වෙළෙඳ ණයගැතියන්ට සහ වෙළෙඳ ණයහිමියන්ට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| විස්තරය | වෙළෙඳ ණයගැතියෝ (රු.'000) | | |
|---|---|---|---|
| | අමල් | බිමල් | චාමර |
| 2023.12.01 දිනට ශේෂය | 100 | 50 | 150 |
| විකුණුම් - 15% ක VAT ඇතුළත්ව | 345 | 460 | 575 |
| මුදල් ලැබීම් | 350 | 450 | 500 |
| දුන් වට්ටම් | — | 25 | 50 |

| විස්තරය | වෙළෙඳ ණයහිමියෝ (රු.'000) | | |
|---|---|---|---|
| | නිහාල් | මාලා | තුෂාර |
| 2023.12.01 දිනට ශේෂය | 80 | 60 | 100 |
| ගැනුම් - 15% ක VAT ඇතුළත්ව | 575 | 690 | 345 |
| මුදල් ගෙවීම් | 500 | 600 | 250 |
| ලද වට්ටම් | 25 | 30 | — |

(iv) 2023 දෙසැම්බර් මාසය තුළදී සිදු වූ වෙනත් ගනුදෙනු:
- අත්පිට විකුණුම් රු. 920 000 ක් විය (*15% ක VAT ඇතුළත්ව*).
- රු. 90 000 ක ක්ෂය වියදම් ද ඇතුළත්ව මෙම මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් රු. 350 000 ක් විය.
- පිරිවැය රු. 300 000 ක් වූ ලී බඩු අත්පිට මුදලට මිල දී ගන්නා ලදී (*VAT නොසලකා හරින්න*).

(v) සිදු වූ දිනයන් දක්වා නොමැති වුවත් ඉහත සියලු ගනුදෙනු දෙසැම්බර් මාසයේ විවිධ දිනයන් හි සිදු වූ බව සලකන්න.

අවශ්‍යවන්නේ:

(1) 2023 දෙසැම්බර් මාසය සඳහා පහත මූලික සටහන් පොත්:

(i) මුදල් ලැබීම් ජර්නලය (ii) මුදල් ගෙවීම් ජර්නලය
(iii) විකුණුම් ජර්නලය (iv) ගැනුම් ජර්නලය

(2) 2023 දෙසැම්බර් මාසය සඳහා පහත ලෙජර ගිණුම්:

(i) මුදල් ගිණුම

(ii) ණයගැති පාලන ගිණුම

(iii) ණයහිමි පාලන ගිණුම

(iv) VAT පාලන ගිණුම

(ලකුණු 30 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

[අවසානය? / පිටුව බලන්න.]

(ආ) TDK රෝහල එහි පැරණි X- කිරණ යන්ත්‍රය වෙනුවට නව X- කිරණ යන්ත්‍රයක් ආදේශනය කිරීමේ ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී. මෙම නව X- කිරණ යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය වසර 5 කි. නව X- කිරණ යන්ත්‍රයේ තාක්ෂණික දියුණුව හේතුවෙන් සමාගමේ මෙහෙයුම් ධාරිතාව ඉහළ යෑම මෙන්ම වාර්ෂික මෙහෙයුම් පිරිවැය අඩු වීමක් ද අපේක්ෂා කෙරේ. මෙම නව යන්ත්‍රය මිල දී ගතහොත් පැරණි යන්ත්‍රය එහි වර්තමාන වෙළෙඳපොළ මිලට විකිණිය හැකි ය.

මේ සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| **පැරණි X- කිරණ යන්ත්‍රය:** | |
| වර්තමාන වෙළෙඳපොළ මිල | 2 000 |
| ඉවත් කිරීමේ වියදම | 200 |
| **නව X- කිරණ යන්ත්‍රය:** | |
| ගැනුම් මිල | 15 000 |
| ප්‍රවාහන සහ සවි කිරීමේ පිරිවැය | 300 |
| අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (*මෙම මුදල, අපේක්ෂිත ඵලදායී ජීවකාලය අවසානයේදී අයකර ගැනීමට හැකි ය.*) | 500 |
| අපේක්ෂිත ඵලදායී ජීවකාලය අවසානයේ සුන්බුන් අගය | 3 000 |
| මුදලින් ගෙවිය යුතු වාර්ෂික මෙහෙයුම් වියදම්වල ඉතුරුම | 500 |
| වාර්ෂික ආයභාරය වැඩිවීම | 3 500 |

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර, එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය (*ආසන්න දශම ස්ථාන දෙකකට*) | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික මුදල් ගලාඒම් සහ ගලායෑම් *එක් එක් මුදල් ප්‍රවාහ අයිතම වෙන වෙනම දක්වමින්*

(2) ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය (වසර)

(3) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)

(4) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව නව යන්ත්‍රය මිල දී ගැනීම සඳහා නිර්දේශය **(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 40 යි)**

5. (අ) රාමා සහ සීතා විසින් ව්‍යාපාර උපදේශන සේවා සැපයීම සඳහා හවුල් ව්‍යාපාරයක් 2022.04.01 දින ආරම්භ කරන ලදි.

(i) හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- **හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ විසර්ජනය සඳහා කොන්දේසි:**

| | |
|---|---|
| හවුල්කරුවන් සඳහා මාසික වේතන - රාමා | රු. 50 000 |
| - සීතා | රු. 40 000 |
| වර්ෂයේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත පොලිය | වාර්ෂිකව 10% |
| ලාභ හෝ අලාභ බෙදාගැනීමේ අනුපාතය | සම සමව |

- වෙනත් කොන්දේසි

| | |
|---|---|
| හවුල්කරුවන් විසින් ලබාදුන් ණය මත පොලිය | වාර්ෂිකව 20% |

(ii) හවුල්කරුවන් විසින් ලබාදුන් ප්‍රාග්ධනයෙහි සාරාංශය සහ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී හවුල් ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත දී ඇත.

- 2022.04.01 දින හවුල්කරුවන් විසින් ලබාදුන් ප්‍රාග්ධනය:

| | **මුදල් (රු.'000)** | **ජංගම නොවන වත්කම් (රු.'000)** | **එකතුව (රු.'000)** |
|---|---|---|---|
| රාමා | 2 400 | 2 600 | 5 000 |
| සීතා | 1 800 | 2 200 | 4 000 |

- 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලද ආදායම් සහ වියදම්:

| | රු.'000 |
|---|---|
| උපදේශන සේවා ආදායම | 10 000 |
| උපදේශන සේවා වියදම් | 6 000 |
| වෙනත් වියදම් (ක්ෂය ද ඇතුළුව) | 1 000 |

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- හවුල්කරුවන් සමඟ ගනුදෙනු:
  - හවුල් ව්‍යාපාරය විසින් ලබාදුන් උපදේශන සේවාවක් සඳහා රු. 100 000 ක් රාමාගේ පෞද්ගලික ගිණුමට ලැබී ඇත. තවද, මෙම උපදේශන සේවාවේ පිරිවැය වූ රු. 60 000 ක් මනුගේ පෞද්ගලික ගිණුමෙන් ගෙවා ඇත. මෙම ගනුදෙනු සම්බන්ධයෙන් කිසිදු සටහනක් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වල තබා නොමැත.
  - රාමා විසින් රු. 200 000 ක මුදලක් වර්ෂය තුළදී ගැනීම් ලෙස ලබාගන්නා ලදී.
  - සීතාගේ වාර්ෂික වේතන මුදලින් ගෙවා ඇති අතර එය වැරදීමකින් උපදේශන සේවා වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.
  - රාමාට අයිති ගොඩනැගිල්ලක් හවුල් ව්‍යාපාරය විසින් 2022.04.01 දින කුලියට ගෙන ඇති අතර, එහි මාසික කුලිය රු. 30 000 ක් විය. වර්ෂය සඳහා කුලිය, ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොතිබුණි. 2023.03.31 දිනට ගෙවිය යුතු මුළු කුලිය, මනු විසින් හවුල් ව්‍යාපාරයට ලබාදුන් අතිරේක ප්‍රාග්ධනය ලෙස සැලකීමට රාමා විසින් යෝජනා කරන ලද අතර, සීතා මේ සඳහා එකඟ විය.
  - සීතා විසින් රු. 1 000 000 ක ණයක් 2022.10.01 දින හවුල් ව්‍යාපාරයට ලබාදෙන ලදී. කෙසේ වුව ද, මේ සඳහා පොලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(iii) නව හවුල්කරුවකු බඳවා ගැනීම:

2023.03.31 දින හවුල්කරුවකු ලෙස ගජබා බඳවාගන්නා ලදී. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. ගජබා විසින් ඔහුගේ ප්‍රාග්ධනය සහ කීර්තිනාම කොටස සඳහා රු. 4 600 000 ක මුදලක් ගෙනඑන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගලපනු ලබයි. සියලු හවුල්කරුවන් ලාභ හෝ අලාභ සම සමව බෙදාගැනීමට එකඟ විය.

**අවශ්‍යවන්නේ:**

(1) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද ඇතුළත්ව).

(2) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

**(ලකුණු 25 යි)**

(ආ) පහත තොරතුරු නිෂ්පාදන සමාගමක් වන සීමිත අමල් පොදු සමාගමට අදාළ වේ.

| | 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු. 'මිලියන) |
|---|---|
| අයභාරය | 600 |
| විකුණුම් පිරිවැය | 360 |
| මෙහෙයුම් වියදම් | 100 |
| පොලී වියදම | 20 |
| ආදායම් බදු වියදම | 30 |
| බදු පසු ලාභය | 90 |

| | 2023.03.31 දිනට (රු. 'මිලියන) |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 300 |
| තොගය | 200 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 150 |
| මුදල් | 100 |
| මුළු වත්කම් | 750 |
| | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 300 |
| රඳවාගත් ඉපැයුම් | 100 |
| දිගුකාලීන ණය | 250 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 100 |
| හිමිකම සහ මුළු වගකීම් | 750 |

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අතිරේක තොරතුරු:

- 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම විසින් රු. මිලියන 50 ක අතුරු ලාභාංශයක් ගෙවන ලදී.
- 2023.03.31 දිනට සාමාන්‍ය කොටස් සංඛ්‍යාව මිලියන 25 ක් විය. සමාගම විසින් ප්‍රවර්තන වර්ෂය තුළදී නව කොටස් නිකුත් කර නොතිබුණි.
- සීමිත අමල් පොදු සමාගමේ තරගකාරී ආයතනයක් වන සීමිත බිමල් පොදු සමාගමට අදාළ අනුපාත කිහිපයක් පහත දී ඇත.

| | |
|---|---|
| – ශුද්ධ ලාභ අනුපාතය | 21% |
| – හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය | 19% |
| – ණය හිමිකම් අනුපාතය | 65% |
| – කොටසක ඉපැයුම | රු. 3.75 |
| – කොටසක ලාභාංශ | රු. 2.50 |
| – පොලී ආවරණ අනුපාතය | වාර 10 |

අවශ්‍යවන්නේ:

(1) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අමල් පොදු සමාගමේ පහත අනුපාත:

(i) ශුද්ධ ලාභ අනුපාතය
(ii) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය
(iii) ණය හිමිකම අනුපාතය
(iv) කොටසක ඉපැයුම
(v) කොටසක ලාභාංශ
(vi) පොලී ආවරණ අනුපාතය

(2) ඉහත (1) කොටසෙහි ගණනය කරන ලද අනුපාත, සීමිත බිමල් පොදු සමාගමේ දී ඇති අනුපාත සමග සංසන්දනය කරමින් පහත දෑ හඳුනාගන්න.

(i) විකුණුම් මත වඩා ඉහළ ප්‍රතිලාභයක් ජනනය කරන සමාගම
(ii) වඩා ඉහළ තෝලන මට්ටමක් සහිත සමාගම
(iii) සාමාන්‍ය කොටස් හිමියන්ට වඩා ඉහළ ලාභ ප්‍රමාණයක් බෙදාහරින සමාගම (ලකුණු 15 යි)

(මුළු ලකුණු 40 යි)

6. (අ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත නිමාලි පොදු සමාගමේ සාරාංශගත මුදල් ගිණුම පහත දී ඇත.

මුදල් ගිණුම (රු.'000)

| හර | | | බැර |
|---|---|---|---|
| 2022.04.01 දිනට ශේෂය | 650 | ගැනුම් | 2 500 |
| විකුණුම් | 3 500 | වෙළෙඳ ණයහිමියෝ | 5 000 |
| වෙළෙඳ ණයගැතියෝ | 4 750 | මෙහෙයුම් වියදම් | 1 600 |
| බැංකු ණය | 8 500 | බැංකු ණය (ණය ආපසු ගෙවීම් සහ පොලිය) | 3 450 |
| කොටස් නිකුතුව | 4 000 | කාර්යාල උපකරණ | 13 500 |
| මෝටර් රථයක් විකිණීම | 5 800 | ආදායම් බදු | 900 |
| | | 2023.03.31 දිනට ශේෂය | 250 |
| | 27 200 | | 27 200 |

අතිරේක තොරතුරු:

(i) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු ලාභය රු. 4 550 000 ක් විය.
(ii) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයට විකුණුම්, අත්පිට විකුණුම් මෙන් දෙගුණයකට සමාන වේ.
(iii) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයට ගැනුම් රු. 3 000 000 ක් විය.
(iv) විකුණන ලද මෝටර් රථයේ ධාරණ වටිනාකම රු. 3 500 000 ක් විය.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/
/ඊළඟ පිටුව බලන්න.

(v) 2023.03.31 දිනට සහ 2022.03.31 දිනට සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| | 2023.03.31 දිනට (රු.'000) | 2022.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ - ධාරණ වටිනාකම ......... | 25 950 | 16 750 |
| තොගය ......... | 2 500 | 1 200 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ ......... | ? | 1 650 |
| මුදල් හා මුදල් සමාන දෑ ......... | 250 | 650 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ ......... | 3 000 | ? |
| උපචිත බැංකු ණය පොලිය ......... | 200 | 150 |
| ගෙවිය යුතු ආදායම් බදු ......... | 600 | 350 |
| බැංකු ණය ......... | 15 500 | 10 000 |
| මුළු හිමිකම ......... | 13 300 | 4 750 |

**අවශ්‍යවන්නේ:**

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත නිමාලි පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (*මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මුදල් ප්‍රවාහ හෙළිදරව් කිරීමේ දී වක්‍ර ක්‍රමය භාවිත කරන්න.*) **(ලකුණු 20 යි)**

(ආ) කොළඹ පිහිටි සංචාරක ඒජන්සියක් විසින් යාපනයේ ඓතිහාසික ස්ථාන නැරඹීමට දින තුනක චාරිකාවක් සංවිධානය කරනු ලබයි. එක් චාරිකාවක් සඳහා සිටිය හැකි උපරිම සංචාරකයින් සංඛ්‍යාව 10 දෙනෙකි. එක් එක් චාරිකාවේ මුළු පිරිවැය මත පදනම්ව සංචාරක ඒජන්සිය විසින් සංචාරකයින්ගෙන් ගාස්තුවක් අය කරනු ලබයි. සංචාරක ඒජන්සිය විසින් එක් සංචාරයක් සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් පහත පිරිවැය ඇස්තමේන්තු කර ඇත.

| පිරිවැය අයිතමය | ගාස්තුව |
|---|---|
| • කොළඹ සිට යාපනය දක්වා සහ නැවත කොළඹට පැමිණීමට දුම්රිය ප්‍රවේශපත්‍ර ගාස්තුව | එක් පුද්ගලයෙකු සඳහා රු. 7 000 |
| • සම්පූර්ණ චාරිකාව සඳහා නවාතැන් පිරිවැය | එක් පුද්ගලයෙකු සඳහා රු. 30 000 |
| • ඓතිහාසික ස්ථාන නැරඹීම සඳහා වෑන් රථයක් කුලියට ගැනීමේ පිරිවැය | රු. 55 000 |
| • ඓතිහාසික ස්ථානවලට ඇතුළුවීමේ ගාස්තු | එක් පුද්ගලයෙකු සඳහා රු. 5 000 |
| • සම්පූර්ණ චාරිකාව සඳහා ආහාරපාන වියදම් | එක් පුද්ගලයෙකු සඳහා රු. 10 000 |
| • සම්පූර්ණ චාරිකාව සඳහා මාර්ගෝපදේශකයගේ ගාස්තුව | රු. 10 000 |
| • යාපනය අවට ඇති දූපත්වල සංචාරය කිරීමට බෝට්ටුවක් කුලියට ගැනීමේ පිරිවැය | රු. 15 000 |
| • විවිධ වියදම් | එක් පුද්ගලයෙකු සඳහා රු. 3 000 |

වෑන් රථයේ සහ බෝට්ටුවේ මගී ධාරිතාව 10 බැගින් වේ.

අවශ්‍යවන්නේ:

(1) එක් චාරිකාවක් සඳහා මුළු ස්ථාවර පිරිවැය

(2) එක් පුද්ගලයෙකු සඳහා විචල්‍ය පිරිවැය

(3) සංචාරක ඒජන්සිය විසින් එක් පුද්ගලයෙකුගෙන් රු. 71 000 ක් අය කරන්නේ නම් මුළු පිරිවැය ආවරණය කිරීමට චාරිකාවකට සහභාගි විය යුතු සංචාරකයින් සංඛ්‍යාව

(4) පුද්ගලයන් හතර දෙනෙකු චාරිකාවට සහභාගි වන්නේ නම්:

(i) චාරිකාවේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා සංචාරක ඒජන්සිය විසින් එක් පුද්ගලයෙකුගෙන් අය කළ යුතු ගාස්තුව

(ii) එක් පුද්ගලයෙකුගේ දායකය

(iii) සංචාරක ඒජන්සිය විසින් චාරිකාවෙන් රු. 20 000 ක ලාභයක් අපේක්ෂා කරන්නේ නම්, එක් පුද්ගලයෙකුගෙන් අය කළ යුතු ගාස්තුව **(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/